නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 01

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# නිරුත්තර කඳුළු

දෑස් අග නොරැඳී රුඳුණු....
නිරුත්තරයි කඳුළු පොදි,
වැටී නොවැටුණු,
ගිම් කතරක හුල්ලන
නග්න දෙපයක කිලිටි ස්පර්ශයෙන්....
තනිකඩ යි ඈ....
නොමැති ව ශ්වේත සළු
හති හලන රක්ත බිඳු

නෙලුම් පෙති පහසෙ මතකෙට
පොරකන ගිජු ලිහිණි රැනක
අඳ නෙත් ගැටුණු ඈ ළය
නිරුත්තරයි
පැරෙන මතක අබියස
මියැදෙන කොපුල් තල
පරවුණු බිම්මලකි ඈ අද

වසුරු ගැරහුම් මදි නැති
දේවාලෙ බිඳෙන පොල් ගෙඩි
නිරුත්තරයි බිඳින ඉකි....
අඩිය ගැලවුණු කුණු බක්කියේ
ඈ නමින් ඉතුරු කළ දං ගෙඩි
පාට අකුරෙන් ලියවුණෙ
"බිඳුණු වීදුරු පමණි!"

නිදොස් නොවූ ඇගෙ හසරැලි
මලානික නිය කැඩි කැඩී
ධවල කෙහෙරැලි පැටළුණු
සල්ලාල හුළඟට නෑ හති....
දොස් නැඟූ සැණෙකින් පමා වූ ඈ අඩිය
නිරුත්තරයි අද
පිච්චෙන සීත මතක පිරි
ගොළු හදවතක රස්නෙට.

සමාලි නවෝදා ඉරුගල් බණ්ඩාර
දෙවන වසර
මානව ශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
samaliirugalbandara@gmail.com

9 772950 655005